# අපේ යුගයේ අභියෝගය ජය ගනිමු

කෘෂිකර්මය සදාකාලික අභියෝග යක් වෙයි. මෙම අභියෝගය ජය ගැනීම සඳහා මෙම යුගයේ දී නව සංකල්ප හා ප්‍රතිපත්ති පිළිබඳව විශේෂයෙන් විමයිලිමත් විය යුතුය. පෙර සිට පැවත එන පුරුදු සමහර විට වෙනස් කළ යුතු ද වේ.

අප කුමන ප්‍රතිපත්තියක් අනුගමනය කළත්, සමහර යථාර්ථයන් වෙනස් කළ නො හැකිය. නිදසුනක් වශයෙන් එක්කෝටි හැට ලක්ෂයක් වන ශ්‍රී ලංකාවේ ජනතාවට ඇත්තේ වර්ග කිලෝ මීටර් 65, 000 ක භූමි ප්‍රදේශයකි. ඒ අනුව ජනගහනය හා භූමියේ සමානු පාතිකත්වය අතිශයින් කුඩා වී ඇත. මෙම තත්ත්වය ඉදිරියේ දී තව දුරටත් වැඩි වනු ඇත.

◆ ◆ ◆ ◆

තවත් පැහැදිලිව පෙනී යන කරුණක් නම් වැසි ජලයට අපේ නතුවීම සහ එමගින් ඇති වන පාලනයන් හා සීමා වන්‍ය. ඉඩම් වලට වාරි ජලය සැපයීමට පියවර විශාල සංඛ්‍යාවක් ගෙන ඇත්තේ වී නමුදු අපේ ගොවීන් බොහෝ දෙනෙක් තව මත් වැසි ජලයේ පිහිට පතති.

**අප විසින් මතක තබාගත යුතු තවත් කරුණක් නම් ශ්‍රී ලංකාවෙ ගොවි ජනතාවගෙන් සියයට 76 කට ම හිමි වී ඇත්තේ හෙක්ටයාර යකට වඩා අඩු කුඩා බිම් කැබලි බවයි. සමහර විට ශ්‍රී ලංකාවට පමණක් විශේෂිත මෙම තත්ත්වයෙන් පැහැදිලිවන එක් වැදගත් කරුණක් නම් දිවයිනේ වෙසෙන අප සැම දෙනාට ඉඩම් මහාර්ඝ වස්තුවක් වන බවයි. එබඳු තත්ත්වයක් යටතේ ඉඩම් අපතේ යැවීම විනාශකාරී කටයුත්තක් වෙයි. මෙලෙස ඉඩම් අපතේ යැම කිහිප අතකින් සිදු වේ. ඉන් එකක් වන උපරිම වශයෙන් ඉඩම්වලින් ප්‍රයෝජන නොගැනීම, කෙසේ හෝ වැළැක්විය යුතුය. වගා කළ හැකි සෑම සෙන්ටිමීටරයෙන් ම උපරිම ලෙස ප්‍රයෝජන ගැනීමේ වැදගත්කම දිනෙන් දින වැඩි වේ.**

කෘෂිකර්ම, ආහාර හා සමුපකාර අමාත්‍ය

**ගරු ලලිත් ඇතුලත්මුදලි විසිනි**

අප විසින් මතක තබා ගතයුතු තවත් කරුණක් නම් ශ්‍රී ලංකාවේ ගොවි ජනතාවගෙන් සියයට 70 කට ම හිමි වී ඇත්තේ හෙක්ටයාරයකට වඩා අඩු කුඩා බිම් කැබලි බවයි. සමහර විට ශ්‍රී ලංකාවට පමණක් විශේෂිත මෙම තත්ත්වයෙන් පැහැදිලිවන එක් වැදගත් කරුණක් නම්, දිවයිනේ වෙසෙන අප සැම දෙනාට ඉඩම් මහාර්ඝ වස්තුවක් බවයි. එබඳු තත්ත්වයක් යටතේ ඉඩම් අපතේ යැවීම විනාශකාරී කටයුත්තක් වෙයි. මෙලෙස ඉඩම් අපතේ යැම කිහිප අතකින් සිදු වේ. ඉන් එකක් වන උපරිම වශයෙන් ඉඩම්වලින් ප්‍රයෝජන නො ගැනීම කෙසේ හෝ වැළැක්විය යුතුය. වගා කළ හැකි හැම සෙන්ටිමීටරයෙන් ම උපරිම ලෙස ප්‍රයෝජන ගැනීමේ වැදගත්කම දිනෙන් දින වැඩි වේ.

◆ ◆ ◆



අපණයන බෝගවලට අවධානය යොමු කළ යුතුය

අපේ රටේ හැම දෙනා තුළම ඇති කළ යුතු තවත් සංකල්පයක් නම් ඉඩම්වල අයිතියක් නැති බවත්, ඇත්තේ ජනතාව වෙනුවෙන් පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් දරණ භාරකාරත්වයක් පමණක් බවත්ය. යම් පුද්ගලයෙක් හිමි කර ගෙන ඇති ඉඩම් වලින් උපරිම ප්‍රයෝජන නොගන්නේ නම් එයින් ඔහුට පමණක් නොව මුළු රටටම විශාල පාඩුවක් සිදු වන්නේය.

ශ්‍රී ලංකා කෘෂිකර්මයේ විශේෂිත වැදගත් අංශයක් වන්නේ සහල් නිෂ්පාදනයයි. අප රටේ සහල් නිෂ්පාදනය හා දිර්ග කාලීනව බැදී ඇති ඓතිහාසික හා සංස්කෘතිකමය සබඳතා අමතක කළ නොහැකිය. කිසිදු සැකයකින් තොරව අපට සතුටු විය හැකි ආකාරයට සහලින් ස්වයංපෝෂිත තත්ත්වයට අපි ලඟා වී සිටිමු. එහෙත් මෙම සතුටුදායකත්වය ඇති වී තිබෙන්නේ ආරක්ෂක හේතුන් හා සංස්කෘතිකමය අංග ලක්ෂණ මතය. සංඛ්‍යා ලේඛණ වලින් ද පෙන්වා දෙන පරිදි, යථාර්ථය වන්නේ ශ්‍රී ලංකා සහල් නිෂ්පාදනයේ වානිජමය හැකියාවන් ඉතා අල්ප මට්ටමක පැවතීමය. කෙටියෙන් පවසතොත් නියම තත්ත්වය නම් අපේ පලදායිතාවය ලෝකයේ සාමාන්‍ය මට්ටමට වැඩි වෙද්දී අපේ නිෂ්පාදන වියදම ලෝක මට්ටම ඉක්මවා ගොස් ඇති බවයි.

◆ ◆ ◆ ◆

සහල් නිෂ්පාදනය සම්බන්ධිත තවත් කරුණු කිහිපයක් අප අමතක නො කළ යුතුය. නිදසුනක් ලෙස තෙත් කලාපයේ සහල් නිෂ්පාදනයට අවශ්‍ය පමණට වඩා ප්‍රමුඛත්වයක් තිබීම පෙන්විය හැකිය. තෙත් කලාපයේ වී වගාවන් බොහොමයක් කෙරෙන්නේ ජලය බැස යාම දුෂ්කර හා වගාවට වැඩි වියදමක් දැරිය සුතු අහස් දියේ පිහිට පතන ක්ෂාරිය පසකින් යුතු මඩ ඉඩම්වලය.

අපේ කෘෂිකාර්මික වැඩ සටහන් වල දී, මෙම ඉඩම් වී වගාවට යොදගැනීමේ පල ප්‍රයෝජන සොයා බලා එම ඉඩම්වල වඩාත් සුදුසු වාණිජමය බෝග වගා කළ හැකි දැයි සොයා බැලීමට මෙමඅවස්ථාව සුදුසු වන්නේ ය.

◆ ◆ ◆ ◆

**ශ්‍රී ලංක කෘෂි නිෂ්පාදන වාණිජකරණය කිරිම අත්‍යාවශ්‍ය කටයුත්තක් වේ. ඈත අතීතයේ සිට පැවත එන සම්ප්‍රදායික හා සංස්කෘතික අගයයන් නිසා පාරිභෝජනය සඳහා නිෂ්පාදනය කළ යුතුය යන සංකල්පය අපේ ගොවීන් හා ඉඩම් හිමියන් තුළ මුල් බැස ගෙන ඇත. මේ මතය වෙනුවට වෙළෙඳාම මුල් කරගත් නිෂ්පාදන රටාවන් බිහිකිරිමට දැන් කාලය එළඹ තිබේ. වෙන වචන වලින් කිවහොත් ගොවියා වගා කල යුත්තේ විකිණිම සඳහා මිස ආහාර සඳහා නොවේ.**

**අප මුහුණ දෙන අභියෝගය නම් ගොවියා යැපුම් කෘෂිකාර්මික රටාවෙන් වාණිජමය කෘෂිකර්මය වෙත යොමු කිරිමය. මේ නිසා වෙළඳ පොල සඳහා නිෂ්පාදනයන් බිහි කිරිම සඳහා ජාතික මට්ටමෙන් ගොවිපල මට්ටමෙන් නිෂ්පාදන රටා සකස් කිරිම අවශ්‍ය වේ. දේශීය මෙන්ම විදේශීය වෙළෙඳ පොල වලට අවශ්‍ය බෝග, අලෙවිය පිළිබඳ පර්යේෂණයන්ද මෙයට ඇතුලත් වන අතර එබඳු වෙළඳ පොල වලට අවශ්‍ය භාණ්ඩ නිපදවිමට අවශ්‍ය පර්යේෂණ හා ව්‍යාප්ති සේවාවන්ට ප්‍රමුඛත්වය දිය යුතුය. දැනට අපේ රටේ අපණයන ආදයමින් සියයට 6 ක් පමණ වන කෘෂි නිෂ්පාදන ප්‍රමාණය මේ මගින් වැඩි කළ හැකිය.**

මෙ කාර්යයෙහිදී අප මුහුණ දෙන අභි-යෝගය නම් ගොවියා යැපුම් කෘෂිකාර්මික රටාවෙන් වාණිජමය කෘෂිකර්මය වෙත යොමු කිරිමය. මේ නිසා වෙළඳ පොල සඳහා නිෂ්පාදනයන් බිහි කිරීම සඳහා ජාතික මට්ටමෙන් ගොවිපල මට්ටමෙන් නිෂ්පාදන රටා සැළසුම් සකස් කිරිම අවශ්‍ය වේ. දේශීය මෙන්ම විදේශීය වෙළඳ පොල වලට අවශ්‍ය බෝග, අලෙවිය පිළිබඳ පර්යේෂණයන් ද මෙයට ඇතුලත් වන අතර එබඳු වෙළඳ පොල වලට අවශ්‍ය භාණ්ඩ නිපදවීමට අවශ්‍ය පර්යේෂණ හා ව්‍යාප්ති සේවාවන්ට ප්‍රමුඛත්වය දිය යුතුය. දැනට අපේ රටේ අපණයන ආදයමින් සියයට 6 ක් පමණක් වන කෘෂි නිෂ්පාදන ප්‍රමාණය මේ මගින් වැඩි කළ හැකිය.

◆ ◆ ◆ ◆

මේ සඳහා විවිධ දේශගුණික කලාපයන්ට උචිත, ආයෝජනයට සුදුසු ලාභදායකත්වයක් ඇති නිෂ්පාදන වියදම් අඩු හා අපණයන කළ හැකි භෝග වගා රටාවන් බිහි කළ යුතුය. මේ සඳහා දැනටමත් දිස්ත්‍රික් හා උප දිසාපති කොට්ඨාශ මට්ටමින් සුදුසු බෝග හඳුනා ගෙන ඇත. නිදසුනක් වශයෙන් මොණරාගල දිස්ත්‍රික්කයට දෙහි, නාරං, කෙසෙල්, ඉරිඟු, කව්පි, මුං මිරිස්, රටකජු, සෝයා, බෝංචි, රතුළූණු හා ලොකු ළූණු සුදුසුය. මන්නාරම දිස්ත්‍රික්කයේ අඹ, නාරං, දෙහි, කෙසෙල්,මිරිස්, උඳු, හා රතුළූණු, වැවිය හැකිය. පැපොල්, අලි ගැට පේර, නාරං, දෙහි, කෙසෙල්, සෝයා බෝංචි, ඉරිඟු, මිරිස්, ලොකු ළූණු, මුං කව්පි, සහ තල මාතලේ දිස්ත්‍රික්කයට උචිත වන අතර ගම්පහ දිස්ත්‍රික්කයේ පැෂන් ෆෲට්, අන්නාසි, කෙසෙල්, දෙහි, රඹුටන්, හා මැංගුස්ටින් වගා කළ හැකි වේ. දකුණු පළාතේ, හම්බන්තොටට ඉරිඟු, මිරිස්, මුං කව්පි, තල සෝයා, දෙහි, නාරං, අඹ හා කෙසෙල් උචිතය.

වෙළඳ පොල හඳුනාගත් පසුව. ඊ අලෙවි මණ්ඩලය වැනි අලෙවි ආයතන ප්‍රතිසංවිධාන කළ යුතුය. මෙම අලෙවි ආයතන වලට ප්‍රති මූල්‍ය යෙදවීම හා පහසු දායක ණය වැනි පහසුකම් ලබා දිය යුතුය. වෙළඳ පොලට සුදුසු බෝග වගා කිරීමට ගොවීන්ට දිරි දීමනා ලබා දීමට හැකි වනු පිණිස **"කෘෂිකාර්මික භාරකාර අරමුදලක්"** පිහිටුවීමට කට යුතු කළයුතු ද වෙයි.

◆ ◆ ◆ ◆

දේශීය වෙළඳ පොලේ ආහාර ද්‍රව්‍යයන්හි මිල සහතික කෙරෙන ආකාරයට, ආහාර ද්‍රව්‍යයන් අපණයන හා මිල නියම කිරීම් සිදු කරනු ඇත. බෝග වගා කිරීමේ සංවර්ධන වැඩ සටහනක, තවත් ප්‍රශ්නයක් විසඳනු පිණිස සාර්ථක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන වැඩ සටහන් ආරම්භ කළ යුතුය. වී හෝ ඉරිඟු වැනි ඒක බෝග වගා රටාවෙන් ගොවි ජනතාව මුදවා ගෙන ඔවුන් විවිධාංගිකරණ වගා රටාවකට හා වාණිජ කෘෂිකාර්මික ක්‍රමයන් වෙත යොමු කළ යුතුවෙ. **අපේ උපාය මාර්ගයන් හි සාර්ථකත්වයේ පළමු සළකුණු දඹුල්ල ප්‍රදේශයෙන් දැනටම දැක ගත හැකි වී තිබේ.** එම ප්‍රදේශයේ ගොවි ජනතාව මහකන්නයේ වී වගා කළ කුඹුරුවල ම, ජල පහසුකම් අඩු යල කන්නයේ මිරිස් හා ලොකු ළූණු වගා කළහ. හෙක්ටයාරයකට වී වගාවෙන් රුපියල් 5,000 ක ආදයමක් ලැබුණ අතර මිරිස් වලින් රුපියල් 40, 000ක් එම භූමියෙන් ම ඔවුන්ට ලැබිණි. ගර්කින්ස්, වැනි අපනයන භෝග මිල අධික බෝග වගා කිරිමෙන් ඔවුන් ගේ ආදායම විශාල ලෙස වැඩි කරගත හැකි වේ. ඉඩම් හා ජල පහසුකම් අඩු යාපනය වැනි ප්‍රදේශවල සූක්ෂම වගා රටා අවශ්‍ය වන මිල අධික බෝග වැවීමට ගොවීන් දිරිමත් කළ යුතුය.



**ගර්කින්ස් වැනි වෙළෙඳ පොල බෝග වලට මුල් තැනක් හිමිවිය යුතුය**

ගෙවතු වගාව වුව ද වෙළෙඳ පොල සඳහා නිෂ්පාදනයට යොමු කර ගත හැකිය. ඒවා සම්බන්ධ කළ හැක්කේ අතර මැදියෙකු-ආයෝජකයෙකු මගිනි. බීජ නිෂ්පාදනය හා අපණයනය සඳහා මල් නිෂ්පාදනය මෙහි දී ප්‍රමුඛත්වය ගනී. මේ සඳහා ඉතා හොඳ නිදසුනක් නම් හේලිස් සමාගමේ අනුබද්ධ ආයතනයක් වන රත්නපුරයේ බොරලන්දේ පිහිටුවා ඇති කොලිටි සීඩ් සමාගමයි. එය අපණයනය සඳහා වැඩි දියුණු කළ මල් බීජ නිපදවයි. හෙක්ටයාරයකට වඩා අඩු භූමි භාගයක පිහිටුවා ඇති හරිත නිවාස වල පුද්ගලයන් 198 දෙනෙකුට රැකියා සැපයූ එම ආයතනයේ 1988 ආදායම රුපියල් එක්කෝටි දහසය ලක්ෂයක් විය. මෙම බීජ ගොවිපල් ව්‍යාපාරය සාර්ථක වූ නිසා මීගමුවේ පිහිටි නෙදර්ලන්ත විසිතුරු මල්, නිෂ්පාදන සමාගමේ රුපියල් 70 ලක්ෂයක් වටිනා කොටස් මිල දී ගැනීමට ද එම සමාගමට ඉඩකඩ ලැබිණි.

◆ ◆ ◆ ◆

අපණයන සඳහා අතුරු බෝග හා පළතුරු නිෂ්පාදනය සඳහා දෙන සහනාධාර ප්‍රමාණය වැඩි කළ යුතුය. කුළුබඩු හා ගර්කින්ස් දැනටම මෙරටට විශාල විදේශ විනිමයන් ගෙන දෙන අතර පළතුරු වලට ද ඒ සඳහා විශාල හැකියාවක් ඇත. ලෝක වෙළඳ පොලේ සීනි මිළ ඉහළ යන ස්වභාවයක් දක්නට ලැබෙන නිසා දේශීය පාරිභෝජන සඳහා සීනි නිෂ්පාදනය කළයුතු වේ.

◆ ◆ ◆ ◆

කිරි හා මස් නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා නිෂ්පාදන එක්රැස් කිරීම හා අලෙවි පහසුකම් සහිත සමුපකාර සමිති යටතේ සත්ත්ව නිෂ්පාදන ගොවීන් සංවිධාන කළ යුතුය. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේත් පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේත් සේවා මෙම සමිති මගින් සැපයිය හැකිය. නෙත් කලාපයේ මැදරට හා පහත රට සඳහා උසස් මට්ටමේ ප්‍රජනනකාරක සතුන් බිහි කළ යුතු අතර නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර සමතුලිත තාවයන් ඇති වන ආකාරයට සත්ත්වාහාර කර්මාන්තය ප්‍රති පත්ති සකස් කළ යුතුය.

◆ ◆ ◆ ◆

කෘෂිකර්ම ක්ෂේත්‍රයේහි හා අපණයන ආදායමෙහි පෙරලියක් සිදු කෙරෙන මෙම කටයුත්තට කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව, කර්මාන්ත සංවර්ධන මණ්ඩලය, අපණයන සංවර්ධන මණ්ඩලය වාණිජ බැංකු ආදී ආයතන රැසක් සහාය අවශ්‍ය වේ. පෞද්ගලික අංශයට පවා, කෘෂි ආශ්‍රිත කර්මාන්ත බිහි කිරීම තුළින් මෙම වැඩ පිළිවෙලට මහත් සේ දායක විය හැකිය. ඒ-හරිත විප්ලවය තනිව කළ හැක්කක් නො වන හෙයිනි.

◆ ◆ ◆ ◆

මෙම උපාය මාර්ගයන් ගොවීන්ට පිළිගන්වන්නට ක්ෂේත්‍ර මට්ටමින් සාර්ථක ආදර්ශන බිහිවිය යුතුය. තෝරාගත් උසස් මට්ටමේ මධ්‍යස්ථාන වල ගොවි සහභාගිත්වය ඇති ව කෘෂි උපායමාර්ග ක්‍රියාත්මක කිරීමට වැඩ සටහනක් දැනට ම අරඹා ඇත. මෙම මධ්‍යස්ථාන කෘෂිකාර්මික පලදාවර්ධන ගම්මාන නමින් හැඳින්වේ. මෙම ගම්මාන වල වැදගත්ම ලක්ෂණය වන්නේ උපරිම නිෂ්පාදනය හා සාර්ථක අලෙවියයි. එක් ගමක් සාර්ථක වුව හොත් අපට ලැබෙන අත් දැකීම් ඉමහත්ය. මෙම ගම්මාන වල දී, වී කෙසෙල් වැනි අඩු ආදායම් බෝග

**අපේ උපාය මාර්ගයන් හි සාර්ථකත්වයේ පළමු සළකුණ දඹුල්ල ප්‍රදේශයෙන් දැනටම දැක ගත හැකි වී තිබේ. එම ප්‍රදේශයේ ගොවි ජනතාව මහ කන්නයේ වී වගාකළ කුඹුරුවල ම, ජල පහසුකම් අඩු යල කන්නයේ මිරිස් හා ලොකු ළූණු වගා කළහ. හෙක්ටයාරයකට වී වගාවෙන් රුපියල් 5,000 ක ආදායමක් ලැබුණු අතර මිරිස් වලින් රුපියල් 40,000ක් එම භූමියෙන් ම ඔවුන්ට ලැබුණි. ගර්කින්ස්, වැනි අපනයන මූලික මිල අධික බෝග වගා කිරීමෙන් ඔවුන්ගේ ආදායම විශාල ලෙස වැඩි කර ගත හැකි වේ. ඉඩම් හා ජල පහසුකම් අඩු යාපනය වැනි ප්‍රදේශවල සූක්ෂම වගා රටා අවශ්‍ය වන මිල අධික බෝග වැවීමට ගොවීන් දිරිමත් කළ යුතුය.**

වලින් මිරිස්, රතුළූණු, ගර්කින්ස්, කරදමුංගු, වැනි වැඩි ආදායම් ලැබෙන බෝග වගාවට යොමු වන සැටි ගොවීන්ට දැකගත හැකිය.

◆ ◆ ◆ ◆

ගොවි ජනතාවට වැඩි ආදායමක් ලැබෙන මෙවැනි ගම්මාන බිහි කිරීමෙ හැකියාව 1981 දී අප විසින් වෙළෙඳ හා නාවික අමාත්‍යාංශය මගින් ආරම්භ කරන ලද අපණයන නිෂ්පාදන ගම්මාන වලින් ප්‍රදර්ශණය කෙරේ, ජාතික මට්ටමේ ප්‍රශ්ණ ගම් මට්ටමේ අත්හදා බැලීම් මගින් විසඳීමට එමගින් මනා නිදසුන් සැපයෙන හෙයිනි.

◆ ◆ ◆ ◆

එහෙත අවශ්‍ය මූල ධනය සපයා ගත නො හැකි වුවහොත් මේ සියල්ල අහස් මාළිගා විය හැකිය. මේ සඳහා අවශ්‍ය ණය පහසුකම් සැපයීම සඳහා සමුපකාර ග්‍රාමීය බැංකු හා ණය දෙන සමුපකාර සමිති උපයෝගී කරගත හැකි අතර, මහ බැංකුව මගින් එම ආයතන වලට ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයිය යුතුය. බැංකුවලට වඩා ගොවි ජනතාවට සමීප මෙම ආයතන වල ණය ආපසු ලබා ගැනීමෙ හැකියාව විශාල බව ඒවායෙහි පසුගිය අත් දැකීම් වලින් පැහැදිලි වේ.

◆ ◆ ◆ ◆

අනෙක් වැදගත් අවස්ථාව වන්නේ ජනසවියයි. මෙම ඔක්තෝම්බරයේ සිට පවුල් 1,80,000 කට රුපියල් 25,000 ක ආයෝජන ණය මුදලක් ලැබේ. මෙය ගණනය කළ විට පළමු වටයේදීම ජනසවියෙන් රුපියල් 450 කෝටියක මුදලක් ලැබේ. කෝටි ගණනක ආයෝජනය මුදලක් ලබා දෙමින් ජනසවිය වැඩ පිළිවෙල මගින් ''**සාමූහික නිදහස් ආයෝජනය**'' දිරිමත් කරන නිසා එම ගින් රැකියා විරහිත දශ ලක්ෂයකට පමණ රැකියා අවස්ථා බිහි කෙරෙන කර්මාන්ත බිහි කළ හැකිය. ජනසවියට ගොවිබලය එකතු කිරීම් තුළින් සාර්ථක හරිත විප්ලවයක් බිහිකළ හැක්කේය.



සැලකිය යුතු තවත් පැත්තක්: **පැල හා රෝපණ ද්‍රව්‍ය**

(අද යුගයට අවශ්‍ය කෘෂිකර්ම පිළිවෙත් හා උපාය මාර්ග විස්තර කරමින් කෘෂිකර්ම, ආහාර හා සමුපකාර ඇමති ලලිත් ඇතුලත්මුදලි මහතා කල දෙසුමකින් මෙම ලිපිය සකස් කරන ලදී)